බැංකුවෙන් ලබාගත් රුපියල් දහසක නෝට්ටුවක් උදුරා ගැනීම සඳහා පුද්ගලයෙකුට තවත් දෙදෙනෙකු විසින් එල්ල කළ කිණිසි පහරින් එම පුද්ගලයා මරුමුවට පත් වීමේ පුවතක් මාධ්‍ය තුළ වාර්තා වී තිබිණි. එම මියගිය පුද්ගලයාට අනෙක් දෙදෙනා මුණගැසී ඇත්තේ ඔහුගේ දිනපතා වැඩ මුරය නිමා කොට කසිප්පු පානය කිරීමේ පුරුද්ද ඔස්සේ බවද වැඩිදුරටත් වාර්තා වී තිබිණි.

මෙම පුවත වාර්තා කරනා දිවයින සහ දිනමිණ පුවත්පත් තුළ (ජූනි 06, 2022) වූ පුවත් වාර්තාවන් හි අන්තර්ගතයේ මිය ගිය පුද්ගලයා සම්බන්ධයෙන් සඳහන් කර ඇත්තේ, ඔහු "දෙමළ ජාතික පෙදරේරුවෙකු" ලෙසින් සහ "දෙමළ ජාතික හින්දු භක්තිකයෙකු" ලෙසිනි.

යම් පුවතකට අදාළ නොවන අවස්ථාවන් හිදී පුද්ගලයන්ගේ වාර්ගිකත්වයන් හෝ ආගමිකත්වයන් සඳහන් නොකළ යුතු බව මාධ්‍ය ආචාර ධර්ම පවසයි. ඊට හේතුව, එසේ සෘණාත්මක සන්දර්භයන් තුළ වාර්ගිකත්වයන් හෝ ආගමිකත්වයන් පිළිබඳව හුවා දැක්වීම ඔස්සේ, එම වාර්ගිකත්වයන්/ආගමිකත්වයන් සෘණාත්මකව ඒකාකෘතික වීමට ඇති හැකියාවයි.

ඒ අනුව,

1) මෙහිදී මෙම මියගිය අයගේ වාර්ගිකත්වය හා ආගමිකත්වය පුවතට අදාළ යැයි ඔබ සිතන්නේ ද?

2) මෙම පුවතේ ස්වභාවය අනුව ගත් විට, මිය ගිය අයගේ වාර්ගිකත්වය හා වාර්ගිකත්වය හුවා දැක්වීම ඔස්සේ, එම වාර්ගිකත්වය හා ආගමිකත්වය සෘණාත්මකව ඒකාකෘතික වීමටත්, ඒ ඔස්සේ කොන් කිරීමක් සිදුවීමටත් ඉඩක් නොතිබෙන්නේ ද?

අදාළ නොවන තැන වාර්ගිකත්වයන් හා ආගමිකත්වයන් සෘණාත්මකව ඉස්මතු නොකරමු!